# අ.පො.ස උසස් පෙළ

# ව්‍යාපාර අධ්‍යයනය





## 7.5: වාණිජ බැංකු සපයන සේවා ව්‍යාපාර වල ක්‍රියාකාරීත්වයට ඇතිකරන බලපෑම පෙන්වා දෙයි.

## 7.5 නිපුණතා මට්ටම :

**වාණිජ බැංකු සපයන සේවා ව්‍යාපාර වල ක්‍රියාකාරීත්වයට ඇතිකරන බලපෑම පෙන්වා දෙයි.**

### ඉගෙනුම් ඵල :

- වාණිජ බැංකු සපයන සේවා ලැයිස්තුගත කරයි.
- වාණිජ බැංකු සපයන එක් එක් සේවාව වෙන වෙනම පැහැදිලි කරයි.
- එම සේවා ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරයි.
- තෝරාගත් ව්‍යාපාර ආයතනයක් වාණිජ බැංකුවලින් ලබාගෙන ඇති සේවා විමසා ලැයිස්තුගත කරයි.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## වාණිජ බැංකු සපයන සේවා

| ප්‍රධාන සේවා | අනෙකුත් සේවා |
|---|---|
| 1. තැන්පතු භාරගැනීම<br>2. ණය සැපයීම | 1. නියෝජිත සේවා<br>2. කල්බදු සේවා<br>3. විද්‍යුත් බැංකු සේවා<br>4. උකස් සේවා<br>5. සුරක්ෂිතාගාර පහසුකම්<br>6. විදේශ විනිමය මිලදී ගැනීම් හා විකිණීම<br>7. ණයපත් සේවා<br>8. මුදල් ප්‍රේෂණ කටයුතු<br>9. සංචාරක චෙක්පත් නිකුත් කිරීම.<br>10. ස්වයංක්‍රීය බැංකු සේවා<br>11. ණයවර ලිපි නිකුත් කිරීම<br>12. වෙනත්<br>• රක්ෂණ සේවා<br>• වෛද්‍ය සේවා |

### ❖ නියෝජිත සේවා

ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතා වලදී ගණුදෙනුකරුවන් වෙනුවෙන් නියෝජිතයකු ලෙස කටයුතු කිරීම.

ගණුදෙනුකරුවන්ගේ මූල්‍ය කටයුතු ඉටුකර දීම

**නිදසුන්:**

- සුරැකුම්පත් මිලට ගැනීම හා විකිණීම
- ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම
- ණය උපකරණ රැස්කිරීම හා ගෙවීම
- විදුලි බිල්පත් හා ජල බිල්පත් ගෙවීම


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන අයුරු**

- ✓ ව්‍යාපාර කටයුතු පහසු වීම.
- ✓ කාලය ඉතිරිවීම.
- ✓ අදාළ කටයුතු වෙනුවෙන් විශේෂ පුද්ගල සහාය ලබාගත හැකිවීම.

## ❖ කල්බදු සේවා

ව්‍යාපාරිකයන්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා වෙනත් වත්කම් පාවිච්චි කිරීම පිණිස ව්‍යාපාරිකයන්ගේ ඉල්ලීම පරිදි බද්දට ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම.

**ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන අයුරු**

- ✓ විශාල වටිනාකමකින් යුතු වත්කම් මුළු මුදලම නොගෙවා භාවිතයට ඉඩකඩ ලැබීම.
- ✓ කල්බදු සඳහා ගෙවන කුලිය ආදායම් බද්දෙන් නිදහස් වීම.
- ✓ යන්ත්‍ර යල් පැනීම නිසා සිදුවන පාඩු හා ප්‍රාග්ධන අලාභ මඟ හැරීම.
- ✓ විශාල මුදලක් වැය නොකර / ආයෝජනය නොකර වැඩි ආදායමක් ඉපයීමට හැකි වීම.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

### ❖ විද්‍යුත් බැංකු සේවා

අන්තර්ජාලය හරහා බැංකු කටයුතු සිදුකරගැනීම සඳහා ගණුදෙනුකරුවන්ට සපයා ඇති පහසුකම විද්‍යුත් බැංකු සේවා ලෙස හඳුන්වයි.

**Home banking**

තම පෞද්ගලික පරිගණකය මගින් අන්තර්ජාලය හරහා බැංකුවේ වෙබ් අඩවියට පිවිස රහස් අංකය භාවිතා කොට ස්වයංක්‍රීයව බැංකු පහසුකම් ලබා ගැනීම.



**Tele banking**

ගණුදෙනුකරු බැංකුව වෙත නොගොස් තම දුරකථනය භාවිතා කිරීමෙන් වාණිජ බැංකු කටයුතු සිදුකර ගැනීම.





**ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය**

- ✓ ගණුදෙනුකරුවන් ආකර්ෂණය වීම.
- ✓ ව්‍යාපාරයේ ප්‍රතිරූපය ඉහළ යාම.
- ✓ ව්‍යාපාර කටයුතු පහසු වීම.
- ✓ තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීමට හැකිවීම.


Copyright © e-thaksalawa.moe.gov.lk

## ❖ උකස් සේවා

ස්වර්ණාභරණ ඇපයට තබාගෙන හදිසි මුදල් අවශ්‍යතා සඳහා ණය ලබාදීම.




### ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය

- ✓ හදිසි මුදල් අවශ්‍යතා ඉටුකර ගත හැකි වීම
- ✓ භාහිර බැඳීම් අවම වීම. (තම ස්වර්ණාභරණ නිසා)
- ✓ අවම ලියවිලි වලින්, අවම කාලයකින් ණය මුදල ලබා ගත හැකි වීම.
- ✓ ආරක්ෂාව සම්බන්ධ ගැටලු ඇති නොවීම.

## ❖ සුරක්ෂිතාගාර පහසුකම්

පුද්ගලයන්ගේ රන්, රිදී, මුතු මැණික්, ආභරණ, ඔප්පු වැනි වටිනා භාණ්ඩ හා වැදගත් ලියවිලි ආරක්ෂා කරදීම සඳහා කටයුතු කිරීම.

මෙම සේවය සැපයීම සඳහා වාණිජ බැංකුවල විශේෂිත සේප්පු වෙන්කර ඇත.



### ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය

- ✓ තම වටිනා දෑ ආරක්ෂා කර ගැනීමට අමතර වෙහෙසක් දැරීමට අවශ්‍ය නොවීම.
- ✓ සුළු ගෙවීමකින් සුරක්ෂිතාගාර පහසුකම් ලබාගත හැකිවීම.
- ✓ සුරක්ෂිතාගාර වල ඇති භාණ්ඩ / ලියවිලි පිළිබඳ වගකීම් වාණිජ බැංකු භාර ගැනීම.


Copyright © e-thaksalawa.moe.gov.lk
The National e-learning Portal for The General Education

### ❖ විදේශ විනිමය මිලදී ගැනීම හා විකිණීම

විනිමය පාලන නියමයන් යටතේ ගණුදෙනුකරුවන්ගේ විදේශ මුදල් මිලට ගැනීමත්, ඔවුන්ට අවශ්‍ය විදේශ මුදල් විකිණීමත් හා අදාළ කටයුතු.



**ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය**

- ✓ මහ බැංකුව විසින් නියම කරන ලද අනුපාත (rate) යටතේ විදේශ මුදල් ගණුදෙනු සිදු කරගත හැකි වීම.
- ✓ ආරක්ෂාව තහවුරු වීම.
- ✓ රහස්‍ය බව තහවුරු වීම.

### ❖ ණයපත් සේවා


කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත ආයතන වලින් භාණ්ඩ හා සේවා ලබාගැනීමට හැකිවන පරිදි වාණිජ බැංකු හෝ බලයලත් ආයතන විසින් නිකුත් කරන කාඩ්පත් විශේෂයක් හරහා ලබාදෙන පහසුකමක්.

ණයපත් මඟින් යම් සීමාවක් දක්වා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් මුදල් ලබා ගැනීමේ හැකියාව ද ඇත.














Copyright © e-thaksalawa.moe.gov.lk

**ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය**

- ✓ ව්‍යාපාරයට නොමිලේ ප්‍රචාරණයක් ලැබීම.
- ✓ විකුණුම් ඉහළ යාම.
- ✓ අවදානම අඩු වීම.
- ✓ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම පහසු වීම.

## ❖ මුදල් ප්‍රේෂණ කටයුතු

ගිණුම් හිමියා වෙනුවෙන් ඔහුට ලැබීමට ඇති මුදල් ඔහුගේ ගිණුමට රැස් කිරීම.

විදේශයක සිටින පුද්ගලයෙකුට මුදල් පැවරීම මෙන්ම, විදේශයක සිටින පුද්ගලයන්ගෙන් ලැබෙන මුදල් රැස් කිරීම ද මේ යටතේ සිදු වේ.

**ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය**

- ✓ ව්‍යාපාරයට ලැබිය යුතු මුදල් පහසුවෙන් ලබා ගත හැකි වීම.
- ✓ අමතර පිරිවැයක් දැරිය යුතු නොවීම.
- ✓ ආරක්ෂාව හිමි වීම.

## ❖ සංචාරක චෙක්පත් නිකුත් කිරීම

දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ගණුදෙනු පහසුවෙන් හා ආරක්ෂාකාරීව සිදු කිරීම සඳහා භාවිතා කෙරෙන චෙක්පත් විශේෂයක් ලෙස සංචාරක චෙක්පත් හැඳින්වේ. වාණිජ බැංකු විසින් පොදුවේ පිළිගන්නා මුදල් වර්ග වලින්, විවිධ වටිනාකම් යටතේ සංචාරක චෙක්පත් නිකුත් කරයි.

තමන් සතු මුදල් බැංකුවට ලබාදී එම වටිනා වටිනාකමට බැංකුවෙන් සංචාරක චෙක්පත් ලබාගන්නා අතර, සංචාරයේ යෙදෙන අතරතුර දී එම ප්‍රදේශයේ වාණිජ බැංකුවකට අදාල සංචාරක චෙක්පත ඉදිරිපත් කර නැවත මුදල් ලබා ගැනීමට හැකියාව ඇත. නිකුත් කිරීමේදී බැංකුව සේවා ගාස්තුවක් අය කරයි.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk




**ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය**

- ✓ වංචනික ලෙස භාවිතා කිරීමේ අවදානම අඩුයි.
- ✓ රැගෙන යාම පහසුවීම.
- ✓ පහසුවෙන් මුදල් කරගත හැකි වීම. (පිළිගත් මුදල් ඒකක වලින් නිකුත් කරන නිසා)

### ❖ ස්වයංක්‍රීය බැංකු සේවා

ගණුදෙනුකරුවන්ට තමාට අවශ්‍ය බැංකු සේවා, බැංකුවට නොගොස් දවසේ ඕනෑම වේලාවක ලබාගැනීමට හැකිවන සේ හඳුන්වා දී ඇති විද්‍යුත් අරමුදල් හුවමාරු ක්‍රමයකි.





Copyright © e-thaksalawa.moe.gov.lk


**ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය**

- ✓ කාලය ඉතිරි වීම.
- ✓ අවශ්‍ය ඕනෑම වේලාවක ගනුදෙනු කිරීමේ හැකියාව.
- ✓ පිරිවැය අඩුවීම.
- ✓ කාර්ය මණ්ඩලය අඩුකර ගත හැකි වීම.

### ❖ ණයවර ලිපි නිකුත් කිරීම.

විදේශ වෙළඳාමකදී ඇතිවන ගෙවීමක්, පියවන බවට පොරොන්දු වෙමින් ආනයනකරු ඔහුගේ බැංකුව හරහා අපනයනකරුගේ බැංකුව වෙත නිකුත් කරන ලියවිල්ල ණයවර ලිපියක් ලෙස හඳුන්වයි.

මෙම ණයවර ලිපි ආනයනකරුගේ ඉල්ලීම පරිදි නිකුත් කිරීමේ කටයුතු වාණිජ බැංකු විසින් සිදු කරයි.




**ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය**

- ✓ විදේශ ගණුදෙනු පහසු කරගත හැකි වීම
- ✓ විශ්වාසවන්ත භාවය ඉහල යාම.
  (අපනයනකරුට මුදල් ලැබීම සහතික වීම.)


**අන්තර්ගතය :** ඒ.දයාල් පීරිස්. ගුරුළුගෝමී ම.වි, කළුතර.
**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.
Copyright © e-thaksalawa.moe.gov.lk

### ❖ වෙනත් සේවා

**රක්ෂණ සේවා**

වාණිජ බැංකු විසින් රක්ෂණ සමාගම් සමග සම්බන්ධ වී තම බැංකුවේ ගිණුම් හිමියන් රක්ෂණය කිරීම

**වෛද්‍ය සේවා**

උදා:

E - Channeling

E - Billing

## ප්‍රශ්නය

(01) ඔබ ප්‍රදේශයේ ඇති ව්‍යාපාර ආයතනයක් තෝරාගෙන, එම ව්‍යාපාර ආයතනය වාණිජ බැංකුවලින් ලබාගෙන ඇති සේවා කවරේදැයි සඳහන් කරන්න.

(02)

i) ගණුදෙනුකරු බැංකුව වෙත නොගොස් තම දුරකථනය භාවිතයෙන් වාණිජ බැංකු කටයුතු සිදු කර ගැනීම ...................................................... ලෙස හඳුන්වයි.

ii) බැංකු ණය ප්‍රධාන වර්ග දෙක ......................................., ............................................... ලෙස සඳහන් කල හැකිය.

iii) ස්වර්ණාභරණ ඇපයට තබාගෙන හදිසි මුදල් අවශ්‍යතා සඳහා ණය ලබා දීම ........................................................ ලෙස හඳුන්වයි.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## පිළිතුරු

(ඉහත ප්‍රශ්නය සඳහා පහත ආකාරයට පිළිතුර සකස් වන්නේ නම් යෝග්‍ය වේ)

(01) ව්‍යාපාර ආයතනයේ නම.

කුමර පොත් හල

සේවා

- කල්බදු සේවා
  - ප්‍රවාහන කටයුතු පහසුකර ගැනීමට වෑන් රථයක් ලබා ගැනීමට
- විද්‍යුත් බැංකු සේවා
  - දුරකථන මාර්ගයෙන් බැංකු කටයුතු සිදු කිරීමට.
- සුරක්ෂිතාගාර පහසුකම්.
  - ආයතනයේ වැදගත් ලියවිලි ආරක්ෂා කර ගැනීමට.
- නියෝජිත සේවා
  - ව්‍යාපාර ආයතනයේ රක්ෂණ වාරික ගෙවීමට ස්ථාවර නියෝගයක් ලබා දී තිබීම.
- ණයපත් සේවා
  - හදිසි මුදල් අවශ්‍යතාවයකදී මුදල් ලබා ගැනීමට.
  - ණය පදනම මත තොග අත්පත් කර කරගැනීමට.

(02)

i. දුරකථන බැංකු සේවා (Tele Banking)

ii. ව්‍යාපාරික ණය
පාරිභෝගික ණය

iii. උකස් සේවා


Copyright © e-thaksalawa.moe.gov.lk